# ජේසු තුමන්ගේ අති ශුද්ධවූ ශ්‍රී රුධිරයෙනි

මහෝත්තම වූ ජේසු සමිඳාණෙනි, මාගේ අසීමිත සහ කුරිරු පාපයන් නිසා, මම ඔබ වහන්සේගේ ශ්‍රී හදවත හා දේහය නිරතුරුවම සිදුරු කළෙමි. එහෙත් ඔබ වහන්සේ පෙරළා මා හට එම වේදනාව නුදුන් සේක. ඔබ වහන්සේ මා හට සමාවදී, මා සුවපත් කල බවත්, මා සුවපත් කරන බවත් මම තරයේ විශ්වාස කරමි.

ඔබ වහන්සේගේ ශ්‍රී දේහයට සිදු කළ තුවාල වලින් ගලා හැලෙන රුධිරය සමඟ, ඔබ වහන්සේගේ දයාව අනුකම්පාව මුසු වී, මාගේ තුවාලයන් වෙත, මාගේ ඇතුළාන්තය සහ මාගේ සිරුරේ සෑම ඉන්ද්‍රියක් ( සුවය පතන ඉන්ද්‍රිය සඳහන් කරන්න), වෙතම, ඒ අමිල වූ රුධිරය පතිත වේවා!

ජේසුනි ඔබ වහන්සේ දේව පුත්‍රයාණෝය. මම දෙවියන් වහන්සේගේ දරුවෙක් වෙමි. මනුෂ්‍ය පුත්‍රයාණන් හා මා අතර ඇති එම ප්‍රබල රුධිර සම්බන්ධතාවය කෙරෙහි මා විශ්වාස කරන බැවින්, ඔබ වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් මා දෝවනය කළ මැනව. මාගේ අතීත පාපයන්ගෙන් මා සෝදා හැර, මා නිදොස් කොට, ශාරීරිකවද මානසිකවද අධ්‍යාත්මිකව ද මා බලවත් කළ මැනව.

ඔබ වහන්සේ මාගේ අවශ්‍යතාවයන් දන්නා සේක. මිනිස් උත්සාහයන් හා හැකියාවන් තුළින් ඉටු කර ගත නොහැකි මාගේ අවශ්‍යතාවයන් අසිමිතය. ඔබ වහන්සෙගේ බලවත් එක වදනකින් ඒ සියල්ල මට පහසු වී ඉටු වන්නේය. මා සහ මගේ අනාගතය බාරගත මැනව. සියල්ල සිදු-වනුයේ මාගේ යහපත සඳහා බව අදහමි. ඔබගේ කැමැත්ත දැනුත්, මත්තටත්, සඳහටමත් සිදුවේවා !

ජීවිතයේ මා ලද සියලු වරප්‍රසාදයන්, ප්‍රාතිහාර්යන් හා ආශිර්වාදයන් වෙනුවෙන්, ඔබ වහන්සේට ස්තූති වේවා ! ජේසුනි, ඔබ වහන්සේට ප්‍රසංසාවත් මහිමයත් අත් වේවා!

KURUSA YAGAYA

# ඔබගේ ඖෂධ සමග..

ආදර ජේසුනී,

ඔබ වහන්සේගේ තුවාල වලින් ගලා හැලෙන රුධිරයට ඔබ වහන්සේගේ දයාව අනුකම්පාව සමඟ මෙම ඖෂධ මුසුකරන්න. ඒවා මගේ රුධිර සහ ස්නායු මාර්ගද, සෑම ශෛලයක් හරහාද ගලා යන්නට සලස්වන්න. මා මෙතෙක් නොලත් සුවය, ඔබ වහන්සේගේ එක් වදනකින් පහසු වී ඉටුවන්නේ යයි මම විශ්වාස කරමි. මගේ ශාරීරික සෞඛ්‍ය සහ ජීවය, ඔබ වහන්සේගේ කැමැත්ත ලෙස මට සියල්ල සිදු වේවා!... ජේසුනී ඔබ වහන්සේට තුති වේවා!...

ඔබ වහන්සේගේ දෑතට භාර කරමි.

ප්‍රශංසා වේවා....




## ජේසුස් වහන්සේගේ

## ශ්‍රී ශරීරයෙන් ගැලුවාවූ

## රුධිරයෙන්

## රෝගීවූ අප

## සුවපත් කළ මැනව...